වයස අවුරුදු 16 ට අඩු බාලවයස්කරුවෙකු නීත්‍යානුකූල භාරකාරත්වයේ කැමැත්ත නොමැතිව ගෙන යෑම හෝ බාලවයස්කරුගේ කැමැත්ත සහිතව වුවද තමන් සමඟ යෑමට පෙළඹවීම, දණ්ඩ නීති සංග්‍රහයේ 352 වගන්තිය යටතේ අපහරණ වරදක් ලෙසින් සලකනු ලැබේ.

එම පසුබිම තුළ, බාලවයස්කරුවෙකු කවරෙකු හෝ සමඟ සිය කැමැත්තෙන් පිටව ගියද, එම වරදෙහි වගකීම බැර විය යුත්තේ වැඩිහිටියාට මිස බාලවයස්කරුට නොවේ.

ඒ අනුව, 19 හැවිරිදි අයෙකු විසින් පයාගල පදිංචි වයස අවුරුදු 14 ක පාසල් සිසුවියක් නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කොට ලිංගික අපයෝජනයට ද ලක් කිරීම, ලංකාදීප සහ දිනමිණ පුවත්පත් තුළ වාර්තා වී තිබූ ආකාරය කෙතරම් යෝග්‍ය දැයි විමසා බැලිය හැක.

ඔබ සිතන ආකාරයට,

1) මෙම ලංකාදීප සහ දිනමිණ පුවත් සිරස්තල මගින්, බාලවයස්කරුවෙකු නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීමක් සිදුවී ඇති බවක් හැඟවෙන්නේ ද?

2) එම බාලවයස්කාර දැරියට දෝෂාරෝපණය පැටවීමක් මෙම සිරස්තල ඔස්සේ සිදු නොවන්නේ ද?

3) මෙවැනි වරදක වගකීම බැර විය යුත්තේ බාලවයස්කරුවෙකුට නොව එම වරදට සම්බන්ධ වන වැඩිහිටියෙකුට බව සන්නිවේදනය නොවීම ඔස්සේ, මෙවැනි වරද සාමාන්‍යකරණය වීමේ අවදානමක් නොමැතිද?

4) එසේම ලිංගික අපරාධයකට පාත්‍ර වූවෙකු අපවිත්‍ර වී ඇති බවක් හැඟවෙන "දූෂණය" වැනි යෙදුමක් වෙනුවට මෙහිදී වඩාත් යෝග්‍ය වන්නේ, "ලිංගික අපයෝජනය" යන්න නොවේද?

මූලාශ්‍ර:

https://childprotection.gov.lk/.../Trafficking_Manual...


පැන යෑමක් ද? නැතිනම්,
නීත්‍යානුකූල භාරකාරත්වයෙන්
අපහරණය කිරීමක් ද?
ETHICS EYE
14 පාසල් සිසුවිය මුහුණු පොතේ
පෙම්වතා සමග පැන ගිහින්
රට පුරා කරක් ගහද්දී අත්අඩංගුව
පයාගල දුවේගොඩ පදිංචි 14 හැවිරිදි පාසල් සිසුවියක් මුහුණ පොතෙන් හඳුනාගත් ගාල්ල දොඩංදූව ප්‍රදේශයේ 19 හැවිරිදි ධීවරයකු සමග පැනගොස් ඥාති නිවසක සිටිය දී අතඩංගුවට ගත් බව පයාගල පොලිසිය කියයි.
ලංකාදීප
01.09.2023
නිවෙසින් පැන ගිය 14 වියැති බාලවයස්කාරිය මුහුණුපොතේ පෙම්වතාගෙන් අමාරුවේ වැටිලා
පයාගල හල්කඳවිල දූවෙගොඩ ප්‍රදේශයේ පදිංචි 14 හැවිරිදි පාසල් සිසුවියක් මුහුණු පොතෙන් හඳුනාගත් ... 19 හැවිරිදි ධීවර තරුණයෙකු හා ... පෙම් ඇසුරක් පවත්වා නිවසින් පලාගොස් ... තිස්සමහාරාමයට පැමිණ නවාතැන්ගෙන සිටි කාමරයක් තුළදී බාලවයස්කාරිය දූෂණයට ලක් කළ සැකකාර පෙම්වතා අත්අඩංගුවට...
දිනමිණ
01.09.2023